# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත

---

**[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 ඔක්තෝබර් මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 50.00 **තැපැල් ගාස්තුව :** රු. 35.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත

[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 08 වන දින]

එල්.ඩී.—ඕ. 02/2008(II)

**ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ නවීන ගවේෂණ, සංවර්ධන, නිෂ්පාදන සහ කළමනාකරණ පරිචයන් තුළින් දේශීය ඛනිජතෙල් සම්පත්වල උපරිම ආර්ථික වටිනාකම ලබාගැනීම සඳහා නියාමන සහ කළමනාකරණ ව්‍යුහයක් සකස් කිරීම සඳහා ද; 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ V වන කොටසේ විධිවිධාන හැර, මේ පනතේ සියලු විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මේ පනතට අදාළව කථානායකවරයාගේ සහතිකය පිටසන් කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ V වන කොටසේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එම කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

පනතේ අරමුණු

2. පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු යः-

(අ) ශ්‍රී ලංකාවේ සියලු ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනය සහ කළමනාකරණය ආවරණය කරමින් උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව උපදෙස් ලබා දීම පිණිස ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් පිහිටුවීම;

(ආ) මෙහෙයුම් මාර්ගෝපදේශ සැපයීම ඇතුළුව, ශ්‍රී ලංකාවේ සියලු ඛනිජතෙල් සම්පත්වල සියලු ගවේෂණ,

සංවර්ධන, නිෂ්පාදන සහ කළමනාකරණ ක්‍රියාවලි විධිමත් කිරීම සඳහා නීතිමය රාමුවක් සකස් කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනය සහ කළමනාකරණය හා සම්බන්ධව ස්වාධීන, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් නියාමන රාමුවක් පිහිටුවීම;

(ඇ) පවතින ඛනිජතෙල් සම්පත් සාධාරණ, සුරක්ෂිත සහ පාරිසරික වශයෙන් තිරසර ආකාරයකින් කළමනාකරණය කිරීම; සහ

(ඉ) කොන්ත්‍රාත්කරුවන් සඳහා මූල්‍ය ස්ථායිතාව ලබා දෙන අතර ම රටේ වෙනස් වන ආර්ථික අවශ්‍යතා සපුරාලන මූල්‍ය පාලන ක්‍රම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම.

I වන කොටස

**ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම

3. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් හා එයට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය -

(අ) උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති උපදේශක කමිටුව වෙත නිර්දේශ සිදු කිරීම;

(ආ) පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම; සහ

(ඇ) පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්, ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තයට සම්බන්ධ සියලු නියාමන කර්තව්‍යයන් ඉටු කිරීම,

සම්බන්ධයෙන් වග කිව යුතු ය.

අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) ගවේෂණ බිම් කොටස් සහ සංවර්ධන බිම් කොටස් සීමාංකනය කිරීමට සහ එම බිම් කොටස් නම් කිරීමට අක්වෙරළෙහි සහ ගොඩබිම් ප්‍රදේශවල, පොළවේ මතුපිට ජාලක කොටස් බවට බෙදා වෙන් කරන සිතියමක් පිළියෙළ කිරීම සහ ඒකාබද්ධ අධ්‍යයනයන් සඳහා නම් කළ යුතු ප්‍රදේශ නිර්ණය කිරීම සහ සීමාංකනය කිරීම;

(ආ) 16 වන වගන්තිය ප්‍රකාරව සීමාංකනය කර ඇති සහ නම් කර ඇති පරිදි බිම් කොටස්වල ආයෝජනය සඳහා පවතින බිම් ප්‍රමාණය අලෙවි ප්‍රවර්ධනය කිරීම;

(ඇ) අවශ්‍ය අවස්ථාවල දී, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රමන්ත්‍රන කමිටුව විමසා, එක් එක් ඛනිජතෙල් සම්පත් ගිවිසුමෙහි ඇතුළත් කරන ලද නියමයන් සහ කොන්දේසි කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කිරීම;

(ඈ) මේ පනත ප්‍රකාරව නිකුත් කරනු ලැබීමට නියම කරනු ලැබිය හැකි සියලු බලපත්‍ර සහ සහතික නිකුත් කිරීම සහ ඒවා අවලංගු කිරීම, අත්හිටුවීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම;

(ඉ) මේ පනත ප්‍රකාරව නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා වන බලපත්‍ර ගාස්තුව නිශ්චය කිරීම සහ එම ගාස්තුව අය කිරීම;

(ඊ) ඛනිජතෙල් මෙහෙයුම් නියාමනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(උ) දත්ත රැස්කර ගැනීම, බලපත්‍ර ලබාදීම සහ දත්ත කළමනාකරණය ආදී උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තයට අදාළ සියලු ගිවිසුම්වලට එළඹීම;

(උඅ) මේ පනතේ අරමුණුවලට අනුකූලව යම් නියමයන් සහ කොන්දේසි මත, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක යම් කොන්ත්‍රාත්කරුවකුගේ සහභාගීත්ව අයිතිය පැවරීමට හෝ මාරු කිරීමට අදාළ කාරණා පිළිබඳ අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(එ) මිල ගණන් කැඳවීමේ, ඇගයීමේ සහ ලංසු ප්‍රදානය කිරීමේ ක්‍රියාවලීන් හි දී අවශ්‍ය විය හැකි පරිදි සියලු ව්‍යුහාත්මක සහ වෙනත් පරිපාලනමය සහාය ලබා දීම;

(ඒ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධිකාරියට අවශ්‍ය විය හැකි යම් කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම;

(ඔ) ජාත්‍යන්තර වශයෙන් තරගකාරී උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තයක් නිසි සහ වගකිවයුතු ආකාරයෙන් විධිමත්ව සිදු කිරීම;

(ඕ) යම් චංචල හෝ නිශ්චල දේපළක්, අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකසට දීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ක) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින්, මුදල්වලින් ලැබෙන සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ග) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක විදේශ ව්‍යවහාර මුදලින් ඇතුළුව, ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සහ මේ පනත ප්‍රකාරව ඛනිජතෙල් සම්පත් සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම;

(ච) ඛනිජතෙල් මෙහෙයුම් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා සහ ආපදාවක දී ඛනිජතෙල් මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් මාර්ගෝපදේශ සහ විධානයන් නිකුත් කිරීම;

(ඡ) මේ පනතේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට උපකාරී වන හෝ ආනුෂාංගික වන කටයුතු අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම; සහ

(ට) මේ පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා උපකාරී විය හැකි හෝ ආනුෂාංගික විය හැකි වෙනත් යම් සියලු ක්‍රියාවන් සහ දේවල් සිදු කිරීම.

## II වන කොටස

### අධිකාරියේ පරිපාලනය සහ කළමනාකරණය

**5.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මේ පනත මගින් අධිකාරිය වෙත පවරන ලද, නියම කරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය -

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් -

(i) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iii) ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(iv) ඛනිජතෙල් සම්පත් විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ නිලයට අඩු නොවන ඔහුගේ නියෝජිතයකු; සහ

(v) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු; සහ

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සුදුසුකම් නියම කරනු ලැබිය යුතු නීති, මුදල්, භූ විද්‍යාව, ඛනිජතෙල් කර්මාන්තය, කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල ප්‍රවීනත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා

**6.** (1) පත්කළ සාමාජිකයන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට එය බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරනු ලබන කාල සීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයකට පත්වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව ධූරයේ කාර්ය ඉටුකිරීමට සභාපතිවරයාට නොහැකිවන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින්, වෙනත් යම් පත්කළ සාමාජිකයකු එම පත්කළ සාමාජිකයාගේ සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

7. යම් තැනැත්තකු - මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු ලෙස හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ, වස්තුභංගත්වයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තෙක් වන්නේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරගෙන හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඉ) චරිත දූෂණයකට සම්බන්ධ වරදකට වරදකරු කරනු ලැබ මාස හයකට නොඅඩු කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් ලැබ ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිරදඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තෙක් වන්නේ නම්;

(උ) අධිකාරිය මගින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් දරන හෝ භුක්ති විඳින තැනැත්තෙක් වන්නේ නම්; හෝ

(ඌ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය ඔහු විසින් ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඇත්නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය

8. මණ්ඩලයේ සෑම පත්කළ සාමාජිකයකු ම මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම මගින් ඔහු විසින් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයක එක් වරකට නොවැඩි තවදුරටත් වූ වාරයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

පත් කළ සාමාජිකයින් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

9. (1) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකුට තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත්කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලය වෙත සේවය කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(3) යම් පත්කළ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය හිස්වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, 5(3)(ආ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එකී පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවා ඉතිරිව ඇති කාල සීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(4) රෝගාතුර වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමක් නිසා මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකුට මාස තුනකට නොඅඩු කාලයක් සඳහා තාවකාලිකව ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකිවන අවස්ථාවක දී, ඔහු නොපැමිණෙන කාලය තුළ ඔහු වෙනුවට කටයුතු කිරීමට, අමාත්‍යවරයා විසින් 5(3)(ආ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, ඔහුගේ නොපැමිණීම පිළිබඳ සභාපතිවරයා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන අවස්ථාවක දී, එකී සාමාජිකයා ස්වකීය ධුරය හිස්කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් 5(3)(ආ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

**10.** (1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සභාපතිවරයා සහ නිල බලයෙන් පත් වූ සාමාජිකයන් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

ගණපූරණය සහ මණ්ඩලයේ රැස්වීම්

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාල සීමාව තුළ ඊට සහභාගි වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයින්ට ඊට සහභාගි වන එක් එක් සාමාජිකයන් එකවර දැකිය හැකි සහ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කරන

සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් මණ්ඩලයේ එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(6) අධිකාරිය විසින් කලින් කලට සාදනු ලබන රීති සහ ස්ථාපිත කාර්ය පටිපාටියට අනුකූලව අධිකාරියේ රැස්වීම් පැවැත්වීම සිදුකළ යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**11.** මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මතම පමණක් අවලංගු නොවිය යුතු ය හෝ අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව

**12.** (1) අධිකාරියේ මුද්‍රාව -

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ අවසරය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

III වන කොටස

**ඛනිජතෙල් සම්පත්වල සහ ඛනිජතෙල් දත්තවල හිමිකම සහ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම**

ඛනිජතෙල් සම්පත් සහ ඛනිජතෙල් දත්තවල හිමිකම

**13.** (1) ඛනිජතෙල් සම්පත් සොයා ගනු ලැබ ඇත්තේ යම් පසක් යට ද, එම පස කෙරෙහි යම් තැනැත්තකු සතුව තිබෙන යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ අන්‍යාකාර යම් අයිතියක් නොතකා -

(අ) ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයේ පොළව මතුපිට අභ්‍යන්තරයෙහි; හෝ

(ආ) සාගර පත්ල මත හෝ ඊට යටින් පිහිටි සහ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියේ අවසන් පනතෙහි II වන ඇමුණුමෙහි ඇතුළත් අවබෝධතා ප්‍රකාශය ඇතුළුව එකී සම්මුතිය ප්‍රකාරව පිහිටුවන ලද මහද්වීපික තටකය සහ අනන්‍ය ආර්ථික කලාපය, යාබද කලාපය, දේශීය මුහුදු කලාපය, ඓතිහාසික ජල ප්‍රදේශය සහ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලයෙහි ඊට යටින් පිහිටි භූමියෙහි,

ස්වභාවිකව හටගන්නා සියලු ඛනිජතෙල් සම්පත්වල පරම හිමිකම රජය සතු විය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ යම් ඛනිජතෙල් මෙහෙයුමකට අදාළව ලබාගත් හෝ සකස් කරන ලද සියලු ඛනිජතෙල් දත්තවල අයිතිය රජය සතු විය යුතු අතර, එම ඛනිජතෙල් දත්තවල කළමනාකාරීත්වය සහ පාලනය අධිකාරිය සතු විය යුතු ය.

(3) අධිකාරිය විසින් නියම කරනු ලබන කාර්ය පටිපාටියකට සහ ගාස්තුවලට යටත් ව, වාණිජ, අධ්‍යාපනික හෝ විද්‍යාත්මක භාවිතය සඳහා ඛනිජතෙල් දත්තවලට ප්‍රවේශ වීම පිණිස යම් තැනැත්තකු වෙත අවසරය ලබාදෙමින් අධිකාරිය විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

ප්‍රතිපත්ති උපදේශක කමිටුව

**14.** (1) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා උපදෙස් ලබා දීම පිණිස කර්මාන්ත, වාණිජ, නීති ක්ෂේත්‍රවල සහ වෙනත් විෂය ක්ෂේත්‍රවල විශේෂඥයින්ගෙන් සමන්විත ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ උපදෙස් මත, අමාත්‍යවරයා විසින් අවශ්‍ය පරිදි තවදුරටත් තොරතුරු කැඳවනු ලැබිය හැකි අතර, ඔහු විසින් වෙනත් දේ අතර, එහි දක්වනු ලබන මාර්ගෝපදේශ මූලධර්ම, ක්‍රියාමාර්ග සහ සැලසුම් සහ දේශීය ඛනිජතෙල් සම්පත් ගවේෂණය කිරීම, සංවර්ධනය කිරීම, නිෂ්පාදනය කිරීම සහ කළමනාකරණය කිරීම විධිමත් කිරීමට අදාළව අනුගමනය කරනු ලැබිය යුතු සමුච්චිත ක්‍රියාවලිය අන්තර්ගත වන උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා උපදෙස් ලබා දිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් ඉන්පසුව උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතය ප්‍රදානය කිරීමෙන් පසුව, එම ජාතික ප්‍රතිපත්තිය උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විය යුතු ය.

(6) (අ) ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ප්‍රතිපත්ති උපදේශක කමිටුව විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

(ආ) එම ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ උපදෙස් මත, අමාත්‍යවරයා විසින් දේශීය සහ ගෝලීය වශයෙන් ඛනිජතෙල් කර්මාන්තයේ තාක්ෂණික සහ වාණිජමය සංවර්ධනය ඇතුළුව ඛනිජතෙල් සම්පත් කළමනාකරණ පරිචයන් සහ ක්‍රියාවලීන් හි නව සංවර්ධනයන් සිදු කිරීම සඳහා, සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(ඇ) එවැනි සෑම සංශෝධනයක් ම හෝ වෙනස් කිරීමක් ම මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ සාමාජිකයන් වෙත, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නියමයන්ට අනුව සහ යම් අනුප්‍රමාණයන් මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(8) උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීම සෑම පාර්ශ්වකරුවකුගේ ම කාර්ය විය යුතු ය.

## IV වන කොටස

### බිම් කොටස් හෝ ප්‍රදේශ සීමාංකනය කිරීම සහ නම් කිරීම, ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට හෝ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට එළඹීම සහ ගවේෂණ බලපත්‍ර ප්‍රදානය කිරීම ආදිය

ඛනිජතෙල් සම්පත් ගිවිසුම හෝ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම

**15.** යම් තැනැත්තකු, මේ පනත ප්‍රකාරව, යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට හෝ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට එළඹී ඇත්තේ නම් මිස, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ යම් ඛනිජතෙල් මෙහෙයුමක් පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

ගවේෂණ බිම් කොටස් හෝ සංවර්ධන බිම් කොටස් සීමාංකනය කිරීම සහ නම් කිරීම

**16.** (1) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින්, ඛනිජතෙල් පැවතිය හැකි බවට හඳුනාගෙන ඇති සහ ඛනිජතෙල් මෙහෙයුම් හෝ අධ්‍යයන හෝ පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම සඳහා යම් ආයෝජකයකු වෙත ලබා දීමට නියමිත අක්වෙරළෙහි සහ ගොඩබිම් ප්‍රදේශ ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ගවේෂණ බිම් කොටස් හෝ සංවර්ධන බිම් කොටස් යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බිම් කොටස් සීමාංකනය කිරීම සහ නම් කිරීම සඳහා අධිකාරිය වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(2) ගවේෂණ බිම් කොටස් හෝ සංවර්ධන බිම් කොටස් නම් කිරීම සඳහා, මේ පනතේ 4(අ) වගන්තිය යටතේ පිළියෙල කරන ලද සිතියම් මත පදනම්ව, අධිකාරිය විසින් පහත දැක්වෙන ආකාරයට හඳුනාගැනීම් සිදු කරනු ලැබිය යුතු ය:-

(අ) අක්වෙරළෙහි පිහිටන්නේ නම්, ඛනිජතෙල් තිබිය හැකි ප්‍රදේශය ආශ්‍රයෙන් හඳුනාගැනීම; හෝ

(ආ) ගොඩබිමෙහි පිහිටන්නේ නම්, එය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් හඳුනාගැනීම.

(3) ගවේෂණ බිම් කොටසක් යනුවෙන් හඳුන්වනු ලබන එක් එක් ජාලක කොටසට "බිම් කොටස් හඳුන්වනය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අනන්‍ය යොමු අංකයක් ලබාදිය යුතු ය. අවශ්‍ය වන්නේ නම්, එවැනි ගවේෂණ බිම් කොටස්, අනන්‍ය ලෙස නම් කරනු ලබන වඩා විශාල බිම් කොටස් ලෙස එකට කාණ්ඩ ගත කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ගවේෂණ බිම් කොටසක් නම් කරනු ලැබීමෙන් පසුව, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් එම නම් කිරීම ප්‍රකාශයට පත් කිරීම සඳහා අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ලබා ගත යුතු ය.

නිර්ණය කරන ලද ගවේෂණ බිම් කොටස් සම්බන්ධයෙන් ඛනිජතෙල් මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා යෝජනා කැඳවීම

**17.** අධිකාරිය විසින්, කලින් කලට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති සහ නියෝග මගින් නියම කරනු ලබන යම් කාර්ය පටිපාටියකට අනුකූලව හඳුනාගනු ලැබූ අක්වෙරළෙහි හෝ ගොඩබිමෙහි පිහිටි ගවේෂණ බිම් කොටස් ගවේෂණය කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා දේශීය හෝ විදේශීය වශයෙන් ආයෝජන යෝජනා කැඳවනු ලැබිය යුතු ය.

ඛනිජතෙල් සම්පත් ගිවිසුම

**18.** (1) යම් කොන්ත්‍රාත්කරුවකු විසින් මේ පනතේ විධිවිධානවලට සහ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකට අනුකූලව ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

(2) ගවේෂණ බිම් කොටසක් හා අදාළ අවස්ථාගත කරුණු හේතුවෙන් ආරක්ෂාව සම්බන්ධ, පාරිසරික, සමාජමය, සංස්කෘතිකමය සහ පුරාවිද්‍යාත්මක කාරණාවකට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වන අවස්ථාවක දී, එම කාරණා ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ ඇතුළත් කරනු ලැබිය හැකි ය. ඛනිජතෙල් සම්පත් ගිවිසුම පිළිබඳ සාකච්ඡා කරනු ලැබූ නියමයන් හා කොන්දේසි එක් එක් ගවේෂණ බිම් කොටසට අදාළ ආර්ථික සහ තාක්ෂණික වශයෙන් අවධානය යොමු කරනු ලැබිය යුතු කරුණු සහ යම් සලකා බැලීම්වලට යටත්ව වෙනස් විය හැකි ය.

(3) කොන්ත්‍රාත්කරු විසින්, ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට ඇතුළත් වීමෙන් පසුව, ඛනිජතෙල් මෙහෙයුම් ආරම්භ කිරීමට පෙරාතුව ගවේෂණ බලපත්‍රයක් ඉල්ලුම් කර ලබා ගත යුතු ය.

(4) ගවේෂණ බලපත්‍රය ලැබීමෙන් පසුව අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ දක්වා ඇති ආකාරයට ඛනිජතෙල් මෙහෙයුම් පවත්වාගෙන යාමට කොන්ත්‍රාත්කරුට අනන්‍ය අයිතිවාසිකමක් තිබිය යුතු ය.

**19.** (1) අධිකාරිය විසින් ඒකාබද්ධ අධ්‍යයන සඳහා නම් කරනු ලැබිය යුතු ප්‍රදේශ නිර්ණය කොට සීමාංකනය කරනු ලැබිය හැකි අතර, එම තැනැත්තාගේ පළපුරුද්ද, කීර්තිනාමය සහ මූල්‍යමය හැකියාව මත පදනම්ව මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන යම් තැනැත්තකුගෙන් ඒ සඳහා යෝජනා බාරගනු ලැබිය හැකි ය. ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම

(2) අධිකාරිය විසින් යෝජිත ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම සලකා බලනු ලැබීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි පිළිබඳ සෑහීමකට පත් වීමෙන් පසුව, නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටිවලට අනුකූලව ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමට ඇතුළත් විය යුතු අතර, එය අමාත්‍ය මණ්ඩලය වෙත දැනගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**20.** (1) යම් ගවේෂණ බිම් කොටසක් ඇතුළත ඛනිජතෙල් මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ දී, යම් කොන්ත්‍රාත්කරුවකු විසින් වාණිජ වශයෙන් වටිනාකමක් තිබීමට හැකියාවක් ඇති ප්‍රමාණවලින් ඛනිජතෙල් සම්පත් සොයා ගනු ලබන අවස්ථාවක, එම කොන්ත්‍රාත්කරු විසින් - සංවර්ධන බලපත්‍රය

(අ) එම සොයා ගැනීම පිළිබඳ වහාම අධිකාරිය වෙත දැනුම් දිය යුතු අතර, එම සොයා ගැනීම තක්සේරු කිරීම සුදුසු වන්නේ ද යන්න නිශ්චය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම හෝ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සැලැස්වීම සිදු කළ යුතු ය; සහ

(ආ) නම් කළ ප්‍රදේශයේ පවත්නා ඛනිජතෙල් සම්පත් පැවතීමේ හැකියාව තක්සේරු කිරීමට පිළියෙල කරන ලද වැඩසටහනක් අනුමතය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් ඇගයීමක් හේතුවෙන් වාණිජ වශයෙන් වටිනාකමක් ඇති ඛනිජතෙල් සම්පත් ප්‍රමාණයක පැවැත්ම පිළිබඳ අනාවරණය වන්නා වූ අවස්ථාවක දී, අධිකාරිය විසින්, එම සොයාගැනීම වාණිජමය වශයෙන් වටිනාකමක් ඇති බවට නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(3) කොන්ත්‍රාත්කරු විසින්, (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද වාණිජමය සොයා ගැනීමේ අවස්ථානුගත කරුණු සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් ඇතුළත -

(අ) නියම කරනු ලැබිය හැකි යම් කාරණාවලින්; සහ

(ආ) ගවේෂණ බිම් කොටස ඇතුළත වාණිජමය සොයා ගැනීම සංවර්ධනය සහ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා වන කොන්ත්‍රාත්කරුගේ යෝජනාවෙන්,

සමන්විත විය යුතු සංවර්ධන සහ ආයෝජන සැලැස්මක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය ප්‍රකාරව වාණිජමය සොයා ගැනීමක් වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ඛනිජතෙල් සම්පත් ප්‍රමාණය ගවේෂණ බිම් කොටසක් ඇතුළත හෝ ගවේෂණ බිම් කොටස් එකකට වැඩි ප්‍රමාණයක් ඇතුළත පිහිටන අවස්ථාවක දී, අධිකාරිය විසින් -

(අ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන සහ ආයෝජන සැලැස්ම මත පදනම්ව; සහ

(ආ) ගවේෂණ බිම් කොටස් එකකට වැඩි ප්‍රමාණයක් ඇතුළත පිහිටන්නේ නම් සහ එකී වෙනත් ගවේෂණ බිම් කොටස්වලට අදාළව වෙනත් කොන්ත්‍රාත්කරුවන් සමඟ කිසිදු ගිවිසුමකට එළඹ නොමැති නම්,

සංවර්ධන බලපත්‍රයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට සහ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ දක්වා ඇති නියමයන්ට යටත්ව, සොයා ගැනීමේ සම්පූර්ණ ප්‍රමාණය ඇතුළත් වන ප්‍රදේශයට අදාළව කොන්ත්‍රාත්කරු වෙත නියම කරනු ලැබිය හැකි ආකෘතියකට සාරානුකූලව සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) සංවර්ධන බලපත්‍රය ලබා ගැනීමේ දී, අදාළ සංවර්ධන බලපත්‍රය යටතේ සංවර්ධනය සඳහා පවරන ලද නිශ්චිත බිම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක් කොන්ත්‍රාත්කරු විසින් බිම් කුලියක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

*සහභාගීත්ව අයිතිය මාරු කිරීම හෝ පැවරීම*

**21.** (1) කොන්ත්‍රාත්කරුවකු විසින් අවස්ථාවෝචිත පරිදි, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක, ගවේෂණ බලපත්‍රයක හෝ සංවර්ධන බලපත්‍රයක සහභාගිත්ව අයිතිය මාරු කිරීම හෝ පැවරීම සඳහා අධිකාරිය වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් එකී ඉල්ලුම්පත්‍රය අධිකාරියේ නිර්දේශයන් ද සමඟ එකී ඉල්ලුම් පත්‍රය සහ අධිකාරියේ නිර්දේශය අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අමාත්‍යවරයා වෙත, ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසිවලට යටත් ව, කොන්ත්‍රාත්කරුගේ, යම් හෝ සියලු සහභාගීත්ව අයිතිය මාරු කිරීමට හෝ පැවරීමට ඔහුට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ඉල්ලීමකට අදාළ අමාත්‍ය මණ්ඩලයේ තීරණය ලැබීමෙන් පසුව, එම ඉල්ලීම සිදු කරන කොන්ත්‍රාත්කරු වෙත, එම තීරණය පිළිබඳ දැනුම්දීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

(4) ඛනිජතෙල් සම්පත් ගිවිසුමක, ගවේෂණ බලපත්‍රයක හෝ සංවර්ධන බලපත්‍රයක සහභාගීත්ව අයිතිය මාරු කිරීම හෝ පැවරීම නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

*සහභාගීත්ව අයිතියක් ඇති තැනැත්තන්ගේ වගකීම*

**22.** ඛනිජතෙල් සම්පත් ගිවිසුම අදාළ වන නම් කළ ප්‍රදේශයේ සහභාගීත්ව අයිතියක් ඇති යම් තැනැත්තකු විසින් -

(අ) මෙම පනතේ විධිවිධාන, ඒ යටතේ සාදනු ලබන යම් නියෝග, අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ, ගවේෂණ බලපත්‍රයේ, සංවර්ධන බලපත්‍රයේ හෝ ඒකක සංවර්ධන බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි සහ විධාන සහ මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කරනු ලබන බවට සහතික වීම සඳහා; සහ

(ආ) තුන්වන පාර්ශ්වයකට සිදුවන යම් හානියක් හෝ අලාභයක් සම්බන්ධයෙන්,

වගකිව යුතු ය.

*සේවා සපයන්නන්ට බලපත්‍ර ලබා දීම*

**23.** අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ මිස, යම් තැනැත්තකු විසින්, අදාළ ඛනිජතෙල් සම්පත් ගිවිසුමක ඛනිජතෙල් මෙහෙයුම් සම්බන්ධයෙන් යම්

කොන්ත්‍රාත්කරුවකු වෙත හෝ කොන්ත්‍රාත්කරුවකු සඳහා හෝ කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් (මෙහි මින් මතු "සේවා සපයන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් භාණ්ඩ හෝ සේවා සපයන්නකුගේ කටයුතු සිදු කරගෙන යාම සිදු නොකළ යුතු ය. බලපත්‍රය නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය සහ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

ඒකක සංවර්ධන සැලැස්ම

**24.** (1) වාණිජමය වශයෙන් සංවර්ධනය කරනු ලැබීමේ හැකියාව ඇති ඛනිජතෙල් ආකරයක් -

(අ) ගවේෂණ බිම් කොටස් දෙකකට හෝ වැඩි ප්‍රමාණයකට මධ්‍යස්ථව පිහිටන අවස්ථාවක දී; හෝ

(ආ) සංවර්ධන බලපත්‍ර දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් මගින් නියාමනය කරනු ලබන ප්‍රදේශයක් ආවරණය කරන අවස්ථාවක දී,

අධිකාරිය විසින්, එහි පිහිටා ඇති ඛනිජතෙල් ආකරයේ වඩාත් කාර්යක්ෂම වාණිජමය සංවර්ධනයක් සහතික කිරීම සඳහා, අධිකාරිය විසින් නිශ්චිතව දැක්විය යුතු යම් කාරණාවලින් සහ අවස්ථානුගත කරුණුවල දී එහි වඩාත් කාර්යක්ෂම වාණිජමය සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන වෙනත් යම් කාරණාවලින් සමන්විත වන ඒකක සංවර්ධන සැලැස්මක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඒකාබද්ධව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලෙස, අවස්ථාවෝචිත පරිදි, මුළු ආකරයට ම හෝ බිම් කොටස්වල යම් කොටසකට සම්බන්ධතාවක් ඇති කොන්ත්‍රාත්කරුවන් වෙත නියම කළ යුතු ය.

(2) අධිකාරිය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඒකක සංවර්ධන සැලැස්ම සැලකිල්ලට ගෙන, අවශ්‍ය වන්නේ නම් නියමිත සංශෝධන සහිතව එම ඒකක සංවර්ධන සැලැස්ම අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අනුමතය ලැබීමෙන් පසුව, ඒකක සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් වෙත, ඒකක සංවර්ධන සැලැස්ම අදාළ වනුයේ යම් භූමි ප්‍රදේශයක් ඇතුළත ද එම භූමි ප්‍රදේශය ඇතුළත, නියම

කරනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසි යටතේ ඒකාබද්ධ ඛනිජතෙල් මෙහෙයුම් සිදු කිරීම සඳහා බලය පවරනු ලබන ඒකක සංවර්ධන බලපත්‍රයක් බවට, ඔවුන් වෙත නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍රය මාරු කරනු ලබන බව දැන්විය යුතු අතර, එකී දැන්වීමේ දිනයේ සිට ඔවුන් වෙත නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍රය බලාත්මකවීම අවසන් විය යුතු ය.

V වන කොටස

**ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු**

ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු වීම සඳහා අමාත්‍යවරයා විසින් පුද්ගල මණ්ඩලයක් නම් කිරීම

**25.** (1) ඛනිජතෙල් සම්පත් සංවර්ධනය කිරීමේ සියලු අංශයන් සම්බන්ධයෙන් රජයේ අයිතිවාසිකම් කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ (මේ පනතේ ''ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු'' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම සංස්ථා අස්ථිත්වයක් සංස්ථාගත කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මඟින් එය ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(2) ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු විසින් -

(අ) යම් බද්ධ ව්‍යාපාරයක දී රජයේ සහභාගීත්ව අයිතිය දැරීම සහ නිෂ්පාදනය කරනු ලබන ඛනිජතෙල්වල රජය සතු කොටස කළමනාකරණය කිරීම කරනු ලැබිය යුතු ය;

(ආ) වෙනත් සියලු සහභාගීත්ව අයිතිය දරන්නන් සමග ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ අවශ්‍යතාවන්ට සහ බද්ධ ව්‍යාපාරයට අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් ගවේෂණ බලපත්‍රයක හෝ සංවර්ධන බලපත්‍රයක හෝ ඒකක සංවර්ධන බලපත්‍රයක දක්වා ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතු ය; සහ

(ඇ) වෙනත් සහභාගීත්ව අයිතිය දරන්නන්ගේ ණය සඳහා වෙන් වෙන්ව වගකිව යුතු අතර එක්ව වග නොකිව යුතු ය.

රජයේ සහභාගීත්ව අයිතිය

**26.** රජය විසින් අදාල ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි ජාතික ඛනිජතෙල් මෙහෙයුම්කරු මගින් සහභාගීත්ව අයිතිය දරනු ලබයි.

VI වන කොටස

**මූල්‍ය විධිවිධාන**

නිෂ්පාදන කොටස් බෙදා ගැනීම සඳහා වන නියම

**27.** මූල්‍ය විධිවිධාන සහ අධිකාරිය විසින් සාකච්ඡා කරනු ලැබිය යුතු කොන්ත්‍රාත්කරු සහ රජය අතර නිෂ්පාදන කොටස් බෙදා ගැනීමේ යාන්ත්‍රණය ඇතුළත් සෑම ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

මූල්‍ය ස්ථායිතාව

**28.** යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක මුල් ව්‍යාපෘතියේ ආර්ථික වගකීම් අන්‍යොන්‍ය වශයෙන් පවත්වාගෙන යාම අරමුණු කරගත් යම් මූල්‍ය ස්ථායිතාව පිළිබඳ යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය.

ලාභ සහ ආදායම නිශ්චය කිරීම

**29.** ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, යම් උද්ගාමී ක්‍රියාකාරකම්වල කොන්ත්‍රාත්කරුගේ ආදායම සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

VII වන කොටස

**ප්‍රධාන විධායක නිලධරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය**

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම

**30.** (1) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයකු සිටිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධාන සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පරිපාලනමය මෙහෙයවීම ඇතුළු අධිකාරියේ සියලු කටයුතු කිරීම සඳහා වගකිව යුතු ය.

(3) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සතුව, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම තහවුරු කිරීමේ වගකීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත තිබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ-ජනරාල්වරයා (4) වන උපවගන්තිය යටතේ පවරන ලද ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී මණ්ඩලයට වගකියනු ලැබිය යුතු අතර පිළිතුරු සපයනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

31. අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) මේ පනත යටතේ ඛනිජතෙල් සම්පත් ගිවිසුමක්, ගවේෂණ බලපත්‍රයක්, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමක්, සංවර්ධන බලපත්‍රයක් හෝ ඒකක සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් බිම් කොටසක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, එම එක් එක් බිම් කොටසක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අදාළ සියලු නිල ලේඛන, සිතියම් සහ වෙනත් වාර්තා පවත්වාගෙන යාම;

(ආ) තත් කාර්ය සම්බන්ධයෙන් අධිකාරිය විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයන්ට අනුකූලව එක් එක් අවස්ථාව මත පදනම්ව ඛනිජතෙල් සම්පත් ගිවිසුම් කෙටුම්පත් සකස් කරනු ලැබීම;

(ඇ) ශ්‍රී ලංකාවේ පවත්නා ඛනිජතෙල් සම්පත්වලට අදාළ භූවිද්‍යාත්මක, භූ භෞතික, ඉංජිනේරුමය සහ ආර්ථික දත්ත, එකතු කිරීම, ගොනුකිරීම, විශ්ලේෂනය කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම හෝ එකතු කිරීමට, ගොනුකිරීමට, විශ්ලේෂණය කිරීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සැලසීම සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිගැනීම තහවුරු කිරීම;

(ඈ) භූ විද්‍යාත්මක නියැදිවල තාක්ෂණික ඇගයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවේ කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරනු ලබන ඛනිජතෙල් මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ එකී කොන්ත්‍රාත්කරුවන් විසින් (ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් හෝ අන්‍යාකාරයකින්) පවත්වාගෙන යනු ලබන සියලු පොත්, ලේඛන, වාර්තා, ගිණුම්, නියැදි සහ දත්ත, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඊ) අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන වාර්තා හෝ තොරතුරු සපයන ලෙස අවස්ථාවෝචිත පරිදි, ගවේෂණ බලපත්‍රයක්, සංවර්ධන බලපත්‍රයක් හෝ ඒකක සංවර්ධන බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කොන්ත්‍රාත්කරුවකුට ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම;

(උ) ශ්‍රී ලංකාවේ සොයා ගනු ලබන ඛනිජතෙල් සම්පත් ප්‍රමාණයන් මැනීම සහ ඒවායේ නියැදි ලබා ගැනීම;

(ඌ) ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වැඩසටහන් සහ අයවැය අනුමත කිරීම;

(එ) යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් සම්බන්ධයෙන් සියලු නියාමන කටයුතු ඉටු කිරීම;

(ඒ) අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවන් සඳහා ගාස්තු හෝ වෙනත් යම් ගෙවීම් අයකර ගැනීම;

(ඔ) මණ්ඩලයේ අනුමතයට යටත්ව අවශ්‍ය උපදේශකවරුන් සහ ප්‍රවීණ අනුශාසකවරුන් බඳවාගනු ලැබීම සඳහා අවශ්‍ය වන පරිදි යම් ශක්‍යතා ගොඩනැගීමේ පියවර ක්‍රියාත්මක කිරීම; සහ

(ඕ) අධිකාරියේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන කටයුතු මෙහෙයවීම.

අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමික

**32.** (1) තාක්ෂණික සහ පුහුණු සේවක පිරිස්, පරිපාලන සහ කළමනාකරණ සේවක පිරිස්, අධිකාරියට අවශ්‍ය විය හැකි වෙනත් යම් තැනැත්තන් ඇතුළුව, අධිකාරියට පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය වන පරිදි යම් කාර්ය මණ්ඩලයක් අධිකාරිය විසින් සේවා නියුක්ත කරනු ලැබිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සහ අධිකාරියේ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය යම් සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම

**33.** (1) අධිකාරියේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කර ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියට උසස් අධ්‍යාපන ආයතනවලින් නිලධරයන් පත් කිරීම

**34.** (1) මණ්ඩලයේ ඉල්ලීම මත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු එම නිලධරයාගේ හෝ සේවානියුක්තිකයාගේ සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. එම පත්කිරීම මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් සඳහා විය යුතු අතර, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය සහ එකී ප්‍රධාන විධායක නිලධරයා එකඟ විය හැකි, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව යම් නියම හා කොන්දේසි මත එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මෙන් එවැනිම විනය පාලනයකට යටත් විය යුතු ය.

## VIII වන කොටස

## **ඛනිජතෙල් සම්පත් සංවර්ධන අරමුදල**

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අරමුදල පිහිටුවීම

**35.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන ඛනිජතෙල් සම්පත් සංවර්ධන අරමුදල යනුවෙන් හැඳින්විය යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු යː-

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) මේ පනත යටතේ අධිකාරිය විසින් අයකර ගනු ලබන ගාස්තු;

(ඇ) සියලු ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආදායම්;

(ඈ) ඛනිජතෙල් සම්පත් ගිවිසුම් ප්‍රකාරව එකතු කරනු ලබන සියලු මුදල්; සහ

(ඉ) මේ පනත යටතේ අය කරගනු ලබන දඩ මුදල් ප්‍රමාණයන්.

(2) අධිකාරිය විසින් අරමුදලේ ඇති මුදල් -

(අ) අධිකාරියේ පරිපාලනයට සහ සංවර්ධනයට අදාළ වන වියදම් සහ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා වන වියදම් පියවීම සඳහා;

(ආ) අධිකාරියේ පහසුකම් දියුණු කිරීම සඳහා;

(ඇ) ඛනිජතෙල් මෙහෙයුම්වල යම් හානිකර බලපෑමකින් පරිසරය සංරක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන පර්යේෂණ හෝ මෙහෙයුම් සිදුකිරීම සඳහා;

(ඈ) ශ්‍රී ලංකාවේ විභව ඛනිජතෙල් සම්පත් පැවතීම පිළිබඳව තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි යම් දත්ත අත්කර ගැනීම සඳහා සහ වැඩි දියුණු කිරීම සඳහා;

(ඉ) උද්ගාමී ඛනිජතෙල් ක්ෂේත්‍රය කළමනාකරණය කිරීම වැඩිදියුණු කිරීම සඳහා උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සමඟ සම්බන්ධ ව කර්තව්‍ය ඉටු කරනු ලබන අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ වෙනත් සේවානියුක්තයන්ගේ දැනුම හුවමාරු පුහුණුවීම් සහ ශක්‍යතා ගොඩනැංවීම පිණිස ආයෝජනය කිරීම සඳහා; සහ

(ඊ) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් දැරීමට අවශ්‍ය විය හැකි පරිදි වන වෙනත් යම් සියලු වියදම් ගෙවීම සඳහා,

උපයෝජනය කරනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය, සෑම මුදල් වර්ෂයක් අවසානයේ දී ම, අරමුදලේ පවත්නා මුදල්වලින් සියයට දහයකට සමාන ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**36.** (1) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ගිණුම් විගණනය කිරීමට අදාළ විධිවිධාන, අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

IX වන කොටස

**සාමාන්‍ය විධිවිධාන**

කොන්ත්‍රාත් කරුවන් සඳහා දේපළ අත්කර ගැනීම

37. (1) අවස්ථාවෝචිත පරිදි, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක්, ඒකාබද්ධ අධ්‍යයනය ගිවිසුමක්, ගවේෂණ බලපත්‍රයක්, සංවර්ධන බලපත්‍රයක් හෝ ඒකක සංවර්ධන බලපත්‍රයක් යටතේ කොන්ත්‍රාත්කරු විසින් සිදුකරනු ලබන හෝ සිදුකිරීම සඳහා යෝජනා කරනු ලබන ඛනිජතෙල් මෙහෙයුම් සඳහා යම් ඉඩමක් හෝ ඉඩමක යම් පරවශ්‍යතාවයක් ඔහුට අවශ්‍ය වන අවස්ථාවක දී, ඔහු විසින් එම අවශ්‍යතාවය පිළිබඳව අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ කාර්ය සඳහා, යම් ඉඩමක් හෝ ඉඩමක යම් පරවශ්‍යතාවයක් අධිකාරියට අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඉඩම හෝ එහි පරවශ්‍යතාවය රජය විසින් හෝ අධිකාරිය විසින් (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගනු ලැබිය හැකි අතර, එම පනතේ විධිවිධාන එම ඉඩම හෝ එම පරවශ්‍යතාවය අත්කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා එම ඉඩම හෝ එහි පරවශ්‍යතාවය පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වන බවට සලකනු ලැබිය යුතු ය.

(3) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චිත ඉඩමක් හෝ එහි යම් පරවශ්‍යතාවක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් කොන්ත්‍රාත්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ කාර්ය සඳහා යම් රජයේ ඉඩමක් අවශ්‍ය වන අවස්ථාවක දී, එම කාර්ය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් වශයෙන් යම් රජයේ ඉඩමක් ලබා ගත හැකි කාර්යයක් බවට සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එම ආඥා පනතේ විධිවිධාන එම දේපළ අධිකාරිය වෙත විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් වශයෙන් ලබා දීම සඳහා අදාළ විය යුතු ය.

**38.** අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීමට අදාළව යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව අධිකාරියට නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි විධානවලට බලාත්මකභාවයක් ලබාදීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන

**39.** (1) මණ්ඩලය විසින් 4 වන වගන්තියේ (උ), (ඌ), (ඒ) සහ (ක) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය හැර මේ පනත යටතේ වන මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ යම් නිලධරයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ එම නිලධරයා විසින් එම බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරනු ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් එසේ පවරන ලද එවැනි යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

**40.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ඔහුගේ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය සහ කර්තව්‍යයක් පවරනු ලබන්නේ යම් නිලධරයකු වෙත ද, එම නිලධරයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලබාදෙනු ලැබිය හැකි ආකාරයේ වන යම් විධානයන්ට යටත්ව එවැනි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කළ යුත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට අයිතිවාසිකම තිබිය යුත්තේ ය.

ඇතුලුවීමේ බලතල

**41.** අධිකාරිය විසින් ලිඛිතව බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් ඛනිජතෙල් මෙහෙයුම් සිදුකරනු ලබන යම් වැඩ බිමකට කවර හෝ අවස්ථාවක ඇතුලු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඛනිජතෙල් සම්පත් ගිවිසුමේ හෝ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමේ හෝ වෙනත් යම් ගිවිසුමක නියම සහ කොන්දේසි හෝ ගවේෂණ බලපත්‍රයක්, සංවර්ධන බලපත්‍රයක් හෝ ඒකක සංවර්ධන බලපත්‍රයක් මගින් පනවන ලද නියම සහ කොන්දේසි, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල යම් විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලබන බවට නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශන හෝ සමීක්ෂණ සිදුකරනු ලැබිය හැකි ය.

වාර්ෂික වාර්තාව

**42.** (1) අධිකාරිය විසින් එක් එක් ලිත් වර්ෂය අවසානයේ මාස හයක් ඇතුළත එම වර්ෂය තුළ අධිකාරිය විසින් සිදුකරන ලද කාර්ය පිළිබඳ සම්පූර්ණ ගිණුම් ලබාදෙමින් මූල්‍ය වාර්තාවක් ඇතුළුව වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් වාර්ෂික වාර්තාවේ පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ සියලු සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**43.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා අධිකාරියේ සියලු සාමාජිකයන්, අධිකාරියේ නිලධරයන්, සේවා නියුක්තිකයින් සහ නියෝජිතයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් විය යුතු බව

**44.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු වියදම්

**45.** (1) යම් අධිකරණයක් ඉදිරියේ දී අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකරගත් පිරිවැය පමණක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ වෙනත් සේවා

නියුක්තකයකු විසින් සිදුකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එම ක්‍රියාව එකී තැනැත්තා විසින් සිදුකරනු ලැබුවේ සද්භාවයෙන් වන බවට එම අධිකරණය විසින් තීරණය කරනු ලබයි නම්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් එම වියදම් අයකරගෙන ඇත්නම් මිස, එකී වියදම අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**46.** (1) (අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග උල්ලංඝනය කරනු ලබන; වැරදි

(ආ) 41 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් මේ පනත මගින් හෝ ඒ යටතේ, ඔහුට පවරනු ලැබූ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී එම තැනැත්තාට ප්‍රතිරෝධය දක්වනු ලබන හෝ බාධා කරනු ලබන;

(ඇ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරිනු ලබන;

(ඈ) මේ පනත යටතේ තමා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක හෝ තොරතුරක හෝ ගවේෂණ බිම් කොටසක් හෝ සංවර්ධන බිම් කොටසක් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට හෝ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට එළඹීම සඳහා ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් සිදුකරනු ලබන;

(ඉ) මේ පනත යටතේ තමා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක හෝ තොරතුරක හෝ ගවේෂණ බිම් කොටසක් හෝ සංවර්ධන බිම් කොටසක් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට, ගවේෂණ බලපත්‍රයකට, සංවර්ධන බලපත්‍රයකට, ඒකක සංවර්ධන බලපත්‍රයකට හෝ යම් සංවර්ධන සැලැස්මකට හෝ ඒකක සංවර්ධන සැලැස්මකට එළඹීම සඳහා කරන ලද යම් ඉල්ලීමක යම් සිද්ධිමය කරුණක් සිතාමතාම මග හරිනු ලබන;

(ඊ) යම් ඛනිජතෙල් මෙහෙයුම්වලට සිතාමතාම අලාභ කරනු ලබන හෝ එවැනි මෙහෙයුම් සිතාමතා කඩාකප්පල් කරනු ලබන; හෝ

(උ) ඛනිජතෙල් සම්පත්වල රජයට අයත් කොටස හෝ ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය වංචා සහගත ලෙස හෝ නොසැලකිලිමත් ලෙස රජයට අහිමි කරනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් මිලියන හතරකට නොඅඩු සහ රුපියල් මිලියන සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, ඔහු වරදකරු කරනු ලැබුවේ යම් වරදක් සඳහා ද එකී වරද ඔහු වරදකරු කරනු ලැබූ පසුව ද දිගටම සිදුවන්නේ නම්, එවැනි විටක ඔහු තවදුරටත් වරදක් සිදුකරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් එම වරද සිදුකරගෙන යන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (උ) වන ඡේදය යටතේ වරදකට යම් තැනැත්තකු වදරකරු කරනු ලබන අවස්ථාවක දී, එම වරද සංයුක්ත වන ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස, රජයට අහිමි වූ අවස්ථාවෝචිත පරිදි ඛනිජතෙල් සම්පත්වල වටිනාකම හෝ ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගයට සමාන මුදලක වන්දියක් රජයට ගෙවන ලෙසට මහෙස්ත්‍රාත්වරයා විසින් එම වරදකරුට නියම කරනු ලැබිය හැකි ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන වැරදි

**47.** මේ පනත ප්‍රකාරව පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදුකරනු ලබන අවස්ථාවක දී, එවිට, එම පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් වන්නේ නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම;

(ආ) ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාපිත නොවන මණ්ඩලයක් වන්නේ නම්, එම මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු ම,

එම වරද සිදුකර ඇති බවට සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් තැනැත්තකුගේ දැනීමෙන් තොරව එම වරද සිදුකළ බවට හෝ එම වරද සිදුකිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්යෝගයෙන් ඔහු ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි කිසිදු තැනැත්තකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

නියෝග

**48.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දෙන ලද හෝ නියම කරනු ලැබ ඇති වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දැක්වෙන කරුණු කිසිවක් හෝ ඒ සියල්ල සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යඃ-

(අ) දත්ත බලපත්‍රගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය;

(ආ) ගවේෂණ බලපත්‍රයක්, සංවර්ධන බලපත්‍රයක්, සහ ඒකක සංවර්ධන බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයේ ආකෘතිපත්‍රය සහ පනත යටතේ නිකුත් කිරීම සඳහා වන එවැනි බලපත්‍රවල ආකෘතිය;

(ඇ) කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා සහ නිර්ණය කරන ලද ගවේෂණ බිම් කොටස් සම්බන්ධයෙන් ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම පිණිස යෝජනා කැඳවීම සඳහා වන කාර්ය පටිපාටිය;

(ඈ) ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට සහ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමකට එළඹීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ ඛනිජතෙල් සම්පත් ගිවිසුමක සහ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමක ඇතුලත් කළ යුතු නිර්ණායක නිශ්චිතව දැක්වීම;

(ඉ) අමාත්‍යවරයාගේ සහ අධිකාරියේ දැනගැනීම සඳහා සහ සංවර්ධනයේ ආයු කාලය පුරාවට අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේ දී තක්සේරු කරන ලද මුදල් ප්‍රක්ෂේපණවල සාරාංශය;

(ඊ) පනත යටතේ අදාළ බලපත්‍ර නිකුත් කිරීමට පෙරාතුව ම සිදුකිරීමට නියමිත -

(i) භූ භෞතික මෙහෙයුම් සහ සමීක්ෂණ;

(ii) භූ විද්‍යුම් ක්‍රියාකාරකම්; සහ

(iii) කිමිදීමේ කටයුතුවල,

විෂය පථය සඳහා වන පිරිවිතරයන්;

(උ) (i) වැඩසටහන්වල සහ ඒකක සංවර්ධන සැලැස්මේ ඇතුලත් කරනු ලැබිය යුතු කාරණා;

(ii) අධිකාරියේ නිලධාරීන් නොවන තැනැත්තන්ගේ, අධිකාරියේ මණ්ඩල සාමාජිකයන්ගේ සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සුදුසුකම්වලට සම්බන්ධ කාරණා;

(iii) ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීම සම්බන්ධයෙන් අදාළ වන පාරිසරික ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව සම්බන්ධ කාරණා; සහ

(iv) දේශීය අන්තර්ගතයට අදාළව ඇතුළත් කළ යුතු කාරණා,

සඳහා වන පිරිවිතරයන්.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ නිසි ලෙස සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) නියෝගයක් පරිච්ඡින්න වන බවට පළ කරනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

**49.** (1) පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි යඃ- රීති

(අ) විවිධ නිලධරයන් පත් කිරීම, සේවා නියුක්ත කිරීම සහ ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ආ) මණ්ඩලයේ රැස්වීම්, වාර්ෂික මහ සභා රැස්වීම් සහ අතිවිශේෂ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඈ) මේ පනත යටතේ සෑදීමට නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) එසේ අනුමත කරන ලද සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීම මත ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

**50.** (1) 2003 අංක 26 දරණ ඛනිජතෙල් සම්පත් පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම, ව්‍යාවර්ථන සහ තාවකාලික විධිවිධාන

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 5 වන වගන්තියේ (5) වන උපවගන්තිය සහ 20 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා ලෙස සහ අධිකාරිය ලෙස හඳුන්වනු ලැබූ සහ කටයුතු කරනු ලැබූ එම අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ අධිකාරිය මේ පනත ආරම්භ වන දිනයට පසුව, තවදුරටත් -

(අ) මේ පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව පත් කරන ලද අධ්‍යක්ෂ-ජනරාල්වරයා; සහ

(ආ) මේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද අධිකාරිය,

බවට සලකනු ලැබිය යුතු ය.

(3) ඉහත සඳහන් පනත ඉවත් කරනු ලැබීම නොතකා -

(අ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව අධිකාරිය සතුව පැවැති සියලු චංචල හා නිශ්චල දේපළ මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද අධිකාරිය සතු විය යුතු ය;

(ආ) මේ පනත ආරම්භ වන දිනයේ පවත්නා 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව අධිකාරිය විසින් හෝ අධිකාරිය සමග එළඹෙන ලද සියලු ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ එකඟතා මේ පනත ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද අධිකාරිය විසින් හෝ අධිකාරිය සමග එළඹෙන ලද ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ එකඟතා ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද සහ මේ පනත ආරම්භ වන දිනයේ දී අවසන් නොවී පවත්නා සියලු සිවිල් සහ අපරාධ නඩු කටයුතු, මේ පනත ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි මේ පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද අවස්ථාවෝචිත පරිදි, සිවිල් හා අපරාධ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පවත්වාගෙන යාම සහ අවසන් කිරීම කරනු ලැබිය යුතු ය;

(ඈ) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව සහ මේ පනත ආරම්භ වන දිනය ට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලබන අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තිකයින් වූ සියලු තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි

මේ පනත යටතේ අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තිකයන් වශයෙන් තවදුරටත් සලකනු ලැබිය යුතු ය;

(ඉ) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව අධිකාරියට පක්ෂව හෝ ඊට විරුද්ධව ගනු ලැබූ සහ මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉටු නොවී පවතින්නා වූ සියලු නඩු තීන්දු සහ අධිකරණ නියෝග මේ පනත ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අධිකාරියට පක්ෂව හෝ ඊට විරුද්ධව ගනු ලැබූ නඩු තීන්දු සහ අධිකරණ නියෝග වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය;

(ඊ) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක නියම යටතේ යම් කොන්ත්‍රාත්කරුවකුට භාණ්ඩ හා සේවා සපයනු ලබන සහ මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, එසේ භාණ්ඩ හා සේවා තවදුරටත් සපයනු ලබන සියලු සේවා සැපයුම්කරුවන් මේ පනත ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනතේ 23 වන වගන්තියේ කාර්ය සඳහා සේවා සපයන්නන් වශයෙන් සලකනු ලැබිය යුතු ය; සහ

(උ) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව මේ පනත ආරම්භ වන දිනය ට පෙරාතුව ම වූ දිනයේ දී අධිකාරිය සතු සියලු අයිතිවාසිකම්, හිමිකම්, වත්කම්, වගකීම්, ණය සහ බැඳීම්, මේ පනත ආරම්භ වන දින සිට අධිකාරියේ අයිතිවාසිකම්, හිමිකම්, වත්කම්, වගකීම්, ණය සහ බැඳීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ප්‍රකාරව සහ මේ පනත ආරම්භ වන දිනය ට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින නිකුත් කරන ලද සියලු බලපත්‍ර සහ සාදන ලද සියලු නියෝග සහ අවස්ථාවෝචිත පරිදි, එක් එක් බලපත්‍රය හෝ ගිවිසුම සම්බන්ධයෙන් අවසන් කරන ලද සියලු දත්ත විකිණීම්, සිදුකරන ලද මැනුම්, ඛනිජතෙල් මෙහෙයුම් හා සම්බන්ධ කාරණා සහ සියලු මෙහෙයුම් වැඩපිළිවෙලවල් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි -

(අ) ප්‍රකාශිතව ඉවත්කරනු ලබන්නේ නම්, හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද නව බලපත්‍ර, එළඹෙන ලද ගිවිසුම් හෝ සාදන ලද නියෝගවලට අනනුකූල වන්නේ නම් මිස, තවදුරටත් වලංගු සහ බලාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය. යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට අවස්ථාවෝචිත පරිදි, අලුත් බලපත්‍ර, ගිවිසුම් හෝ නියෝග බලපැවැත්විය යුතු ය;

(ආ) පටහැනිව ප්‍රකාශිත විධිවිධානයක් සාදනු ලබන්නේ නම් මිස, එම කටයුතු මේ පනත යටතේ අවසන් කරන ලද හෝ සිදුකරන ලද හෝ කරගෙන යන ලද කටයුතු ලෙස තවදුරටත් වලංගු සහ බලාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**51.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"යාබද කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 4 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ යාබද කලාපය බවට ප්‍රකාශයට පත් කරනු ලබන කලාපය අදහස් වේ;

"කොන්ත්‍රාත්කරු" යන්නෙන්, ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ ඛනිජතෙල් මෙහෙයුම් සිදුකිරීමට බලය පවරා ඇති දේශීය හෝ විදේශීය තැනැත්තකු හෝ සංස්ථාවක් අදහස් වන අතර, ඊට ඒකාබද්ධ අධ්‍යයන මෙහෙයුම් ද ඇතුළත් වේ;

"අනන්‍ය ආර්ථික කලාපය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අනන්‍ය ආර්ථික කලාපය අදහස් වේ;

"මූල්‍ය ස්ථායිතාවය" යන්නෙන්, ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තියක් වෙනස් වන විටක යම් මූල්‍ය පරාමිතීන් වෙනස් කිරීම සඳහා ඉඩ ලබා දෙමින් ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට

එළඹෙන අවස්ථාවක දී අන්‍යොන්‍ය වශයෙන් එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත්කරු සහ රජය යන දෙපාර්ශ්වය සඳහා ම එකම ව්‍යාපෘති ආර්ථිකයන් පවත්වාගෙන යාම අදහස් වේ;

"ඓතිහාසික ජල ප්‍රදේශය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ සාදන ලද ප්‍රකාශනය මගින් ප්‍රකාශයට පත් කරන ලද ඓතිහාසික ජල ප්‍රදේශයේ සීමාවන් අදහස් වේ;

"ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම" යන්නෙන්, නිර්ණය කරන ලද ප්‍රදේශයක හයිඩ්‍රොකාබන් විභවය අධ්‍යයනය කිරීමට සහ ඇගයීමට මේ පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව රජය සහ එක් කොන්ත්‍රාත්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකු අතර එළඹෙන්නා වූ ගිවිසුමක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ මේ පනතට අදාළ විෂය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය" යන්නෙන්, රජයේ ජාතික අවශ්‍යතාවය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ හෝ ක්‍රියාකරුවන්ගේ අයිතිවාසිකම් අතර හිමිකම් තුලනය කිරීම සහතික කිරීම පිණිස උද්ගාමී කර්මාන්තය අධීක්ෂණය කිරීමට සහ ඒ සඳහා මඟ පෙන්වීමට පවත්නා අභියෝග හඳුනාගනිමින් සහ ඊට නිර්දේශ සැපයීම මගින් උද්ගාමී ඛනිජතෙල් ක්ෂේත්‍රයේ පොදු මූලධර්ම, කළමනාකරණය, සංවර්ධනය සහ උද්ගාමී ඛනිජතෙල් ක්ෂේත්‍රයේ වෙනත් සියලු අදාළ අංශයන් සැකෙවින් දක්වන්නා වූ ප්‍රතිපත්තියක් අදහස් වේ;

"සිද්ධිමය නොවන නියම සහ කොන්දේසි" යන්නෙන්, යෝජනාවල ප්‍රතිඵල ඇගයීමට ඍජුව බලනොපාන අයිතමයන් අදහස් වේ;

"සහභාගීත්ව අයිතිය" යන්නෙන්, යම් අස්ථිත්වයක හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක හවුල්කරුවකුගේ හිමිකාරීත්ව කොටස හෝ නිකුත් කළ ව්‍යාපාර කොටස්වල අගය අදහස් වේ;

"ඛනිජතෙල් දත්ත" යන්නෙන්, භූවිද්‍යාත්මක, භූභෞතික, භූරසායනික, පාෂාණික ඛනිජ භෞතික, ඉංජිනේරුමය, භූ විදුමේ දත්ත, සිතියම්, චුම්බක පටි, පාෂාණ සාම්පල, විදුම් පාෂාණ කැබලි සහ නිෂ්පාදන දත්ත මෙන්ම ඛනිජතෙල් මෙහෙයුම් සම්බන්ධයෙන් පිළියෙළ කරන ලද වාර්තා, විශ්ලේෂණ, අර්ථ නිරූපණ සහ ඇගයීම් ඇතුළුව සියලු අර්ථනිරූපණ සහ ව්‍යුත්පන්න දත්ත, ආර්ථික දත්ත සහ භූ විද්‍යාත්මක නියැදි ඇතුළුව සියලු තොරතුරු අර්ථ නිරූපණ වාර්තා අදහස් වේ;

"ඛනිජතෙල් මෙහෙයුම්" යන්නෙන්, භූ විද්‍යාත්මක සමීක්ෂණ, භූකම්පන දත්ත අර්ථනිරූපණය, පොළොව හෑරීම, නිෂ්පාදන පරීක්ෂා කිරීම, වෙන්කිරීම, සැකසුම් කිරීම, ගබඩා කිරීම, සොයාගැනීම, ප්‍රවාහනය කිරීම සහ අලෙවි කිරීම ඇතුළත් වන, එහෙත් ඒවාට සීමා නොවන, ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය කිරීම, සහ සොයා ගැනීමේ කටයුතු අදහස් වේ;

"ඛනිජතෙල් ආකරය" යන්නෙන්, ස්වභාවික ආකාරයෙන් හටගන්නා ඛනිජතෙල් සම්පත් එකතුවක් අදහස් වේ;

"ඛනිජතෙල් සම්පත්" යන්නෙන්, යම් ස්ථානයක තිබී හමු වූ හෝ ඛණිජ තෙල් මෙහෙයුම්වල දී සොයාගත් තෙල්වල සහ ගෑස්වල හයිඩ්‍රේට් සල්ෆර් සහ හයිඩ්‍රොකාබන් සමඟ ආශ්‍රිත වෙනත් ස්ථාන, ද්‍රව්‍ය ඇතුළු ස්වාභාවික ද්‍රාවණ, වායු, ඝන ද්‍රව්‍ය හෝ අර්ධ ඝණ ද්‍රව්‍ය වශයෙන් ඇති බොරතෙල්, ස්වභාවික වායු සහ හයිඩ්‍රොකාබන් අදහස් වේ;

"ඛනිජතෙල් සම්පත් ගිවිසුම" යන්නෙන්, නිෂ්පාදන කොටස් බෙදාගැනීම සඳහා රජය සහ එක් කොන්ත්‍රාත්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවන් වැඩි දෙනෙකු අතර මේ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව එළඹෙන ගිවිසුමක් අදහස් වේ;

"ඛනිජතෙල් සම්පත්වල රාජ්‍ය භාගය" යන්නෙන්, සංවර්ධන බලපත්‍රයක් මගින් ආවරණය වන ප්‍රදේශයෙන් සොයාගනු ලබන්නා වූ සියලු ඛනිජතෙල් සම්පත්වල වෙළඳපොළ වටිනාකම මත කොන්ත්‍රාත්කරුවකු විසින් ගෙවනු ලැබිය යුතු රාජ්‍ය භාගය අදහස් වේ;

"දේශීය මුහුදු තීරය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබ ඇති ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරය වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති මුහුදු සීමා අදහස්වන අතර, ශ්‍රී ලංකා අභ්‍යන්තර ජල තීරය ද ඊට ඇතුළත් වේ;

"ඒකක සංවර්ධනය" යන්නෙන්, ගවේෂණ බිම් කොටස් එකක් හෝ කිහිපයක මායිම් තුළ පිහිටි හෝ සංවර්ධන බලපත්‍ර දෙකක හෝ වැඩි ගණනක ආවරණය වන බිම් ප්‍රදේශය තුළ පිහිටියා වූ පොදු ආකරයක සංවර්ධනය අදහස් වේ;

"එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය" යන්නෙන්, 1992 වර්ෂයේ දී ජැමෙයිකා මොන්ටෙගෝ බොක්කේදී (Bay) සම්මත කරගන්නා ලද, 1994 නොවැම්බර් මස 16 වන දින බලාත්මකභාවයට පත්වූ 1994 ජූලි මස 19 වන දින ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය අදහස් වේ; සහ

"උද්ගාමී" යන්නෙන්, කොන්ත්‍රාත්කරුවකු සමඟ ඛනිජතෙල් සහ ස්වභාවික වායු පවතින ස්ථාන හඳුනාගැනීම, පොළව හෑරීම, පරීක්ෂා කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා පියවර ගැනීම පිණිස මූලික වශයෙන් කටයුතු කරනු ලබන සහ ගවේෂණය කිරීම හා සංවර්ධනය කිරීම හා අදාළ වූ ඛනිජතෙල් සහ ස්වභාවික වායු කර්මාන්තයේ මෙහෙයුම් අවධි අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**52.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.